# විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

## සීඝ්‍රයෙන් පැතිරෙන කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය හේතුවෙන් ඊශ්‍රායලය අගුලු දැමීම (Lockdown) සම්බන්ධවයි

කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදනවලට වැඩිමනත් වශයෙනි.

ඔබ සියලු දෙනා දන්නා පරිදි මේ දිනවල ඊශ්‍රායලය තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කොරෝනා වෛරස වසංගත තත්වය හේතුවෙන් එම වෛරසය තවදුරටත් ජනතාව අතර පැතිරයාම අවම කිරීම පිණිස ඊශ්‍රායල් රජය විසින් 2020 සැප්තැම්බර් 18 වන සිකුරාදා ප.ව. 2.00 සිට 2020 ඔක්තෝබර් 11 වන ඉරිදා දින දක්වා පුරා සති තුනක කාලයක් ඊශ්‍රායලය තාවකාලිකව අගුලු දැමීමක් (Lockdown) සිදු කර ඇති බව ප්‍රකාශයට පත් කර ඇත.

එම නිසා ඉහත කාල සීමාව තුල ඊශ්‍රායල් බලධාරීන් විසින් පනවා ඇති නීති රීති සහ රෙගුලාසි මෙන්ම යහපත් සෞඛ්‍ය පුරුදුද අනුගමනය කරමින් ආරක්ෂාකාරීව සිය වාසස්ථානවල රැඳී සිටින මෙන් ඔබ සියළු දෙනාටම දන්වා සිටිනු ලැබේ.

එමෙන්ම අදාළ කාලසීමාව තුළදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලයද තාවකාලිකව වසා දැමීමට සිදුවන බැවින් ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා ප්‍රජාවේ අතිශය හදිසි අවශ්‍යතාවයන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පහත සඳහන් ජංගම දුරකථන අංක ක්‍රියාත්මක වන බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| රුවන් වික්‍රමසිංහ මහතා<br>දෙවන ලේකම් (රැකියා හා සුභසාධන) | - | 054 7215815 |
| කේ. පී. චන්ද්‍රතිලක මහතා<br>පරිවාර නිළධාරි | - | 058 6875764 |

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

18.09.2020